# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## මිල්කෝ සහ NLDB ගොවිපළවල් පවත්වාගෙන යාම සඳහා අමුල් සමාගම සමඟ ඒකාබද්ධ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ යෝජනාව
## 'மில்கோ' மற்றும் 'என்எல்டிபி' பண்ணைகளை நிர்வகிக்க 'அமுல்' பாற்பண்ணைக் கம்பனியுடன் கூட்டு முயற்சியைத் தொடங்குவதற்கான முன்மொழிவு
## PROPOSAL TO START JOINT VENTURE WITH AMUL DAIRY COMPANY TO MANAGE MILCO AND NLDB FARMS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මේ රට දේශීය කිරිවලින් ස්වයංපෝෂිත කිරීම පිළිබඳව හැම වේදිකාවකම කථා වෙනවා. ඉතින්, ඒ මාතෘකාව පිළිබඳව මම මේ වැදගත් ප්‍රශ්නය අහන්න කැමැතියි.

සම්පූර්ණ කොටස් අයිතිය රජය සතුවන සමාගමක් ලෙස පවත්වාගෙන යනු ලැබූ මිල්කෝ ආයතනයට සහ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට - NLDB එකට - අයත් ගොවිපොළවල් රජය මේ වනවිට ඉන්දියානු අමුල් සමාගම සමඟ ඒකාබද්ධ ව්‍යාපාර සමාගමක් - joint venture company, JVC එකක් - වශයෙන් ස්ථාපිත කිරීමට පියවර ගනිමින් සිටින බව වාර්තා වේ.

මෙම ආයතන සතු සම්පත්වලින් උපරිම ඵලදායිත්වයක් ලබාගැනීම සඳහා එම ආයතන මෙහෙයවීමට රාජ්‍ය කළමනාකාරිත්වය අපොහොසත් වී තිබේ. එසේම සුදුසු රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘතියක් හඳුනා ගැනීමෙන් තොරව බොහෝ රාජ්‍ය ව්‍යවසායන් විදේශීය සමාගම් වෙත විකුණා දැමීම සඳහා වත්මන් රජය කටයුතු කරනු ලබයි. එමඟින් සිදුවන්නේ මෙරට මහජන සම්පත් නිසි ඇගයීමකින් තොරව අඩු වටිනාකම් යටතේ විදේශීය සමාගම්වලට පැවරීමත්, ඒ තුළින් වංචා හා දූෂණවලට මුල පිරීමත්ය. එපමණක් නොව, මෙම වතාවරණය ඔස්සේ එම ආයතනවල සේවය කරනු ලබන සේවකයින්ට අද සිය රැකියාව පිළිබඳව දැඩි අවිනිශ්චිතභාවයක් ද මතුව ඇත.

ඒ අනුව, මෙය ජාතික වැදගත්කමකින් යුතු ගැටලුවක් වශයෙන් සලකා පහත සඳහන් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙමි.

1. රජය යළිත් වරක් මිල්කෝ ආයතනය සහ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපළවල් ඉන්දියාවේ අමුල් සමාගම සමඟ ඒකාබද්ධ ව්‍යාපාර සමාගමක් - joint venture company එකක් - වශයෙන් ස්ථාපිත කිරීමට තීරණය කරනු ලැබුවේ කුමන පදනමක් මතද?

2. රජය සහ ඉන්දියානු සමාගම අතර ඒකාබද්ධ ව්‍යාපාර සමාගම ස්ථාපිත කිරීම සඳහා අදාළ ගිවිසුම් මේ වන විට අත්සන් කර තිබේද? එ් කවදාද? ඒකාබද්ධ ව්‍යාපාර සමාගම සඳහා සම්බන්ධ වූ පාර්ශ්ව කවුරුන්ද? එම ගිවිසුම් කොන්දේසි කවරේද? එම ගිවිසුම මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද? නොඑසේනම්, ඒ මන්ද? රජය මීට පෙර, එනම් 1998-2000 කාලය තුළ මෙවැනිම ආකාරයට අමුල් සමාගම සමඟින් සිදු කළ ඒකාබද්ධ වැඩ පිළිවෙළ අසාර්ථක වීමෙන් එම සමාගම ඉවත්ව ගිය අතර, එසේ තිබියදී මෙවරත් රජය එම සමාගම සමඟම ඒකාබද්ධ ව්‍යාපාර සමාගමක් ස්ථාපිත කිරීමට තීරණය කරනු ලැබුවේ ඇයි?

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මීට පෙරත් එම වැඩ පිළිවෙළ සඳහා උත්සාහ දරලා, එය අසාර්ථක වෙලා තිබෙනවා. අපි දැන ගන්න කැමැතියි, ඒ සමාගම් ක්‍රමවේදය තුළම ඉදිරියට යන්නට හේතු වූ කරුණු කාරණා කවරේද කියලා.

3. මිල්කෝ ආයතනය සතු සමස්ත වත්කම් හා වගකීම්වල වටිනාකම කොපමණද? එම සමස්ත වත්කම් පිළිබඳ ලැයිස්තුවක් මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද? නොඑසේ නම්, ඒ මන්ද? ඒකාබද්ධ ව්‍යාපාර සමාගම පිහිටුවීමේදී මිල්කෝ ආයතනය සහ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපළවල් සහ සියලු වත්කම් ඒකාබද්ධ ව්‍යාපාර සමාගමට පැවරීමක් සිදු වන්නේද? නොඑසේ නම්, එලෙස පවරනු ලබන වත්කම් කවරේද? ඒවායේ සමස්ත වටිනාකම කොපමණද? එසේ පවරනු ලබන සියලු වත්කම් පිළිබඳ රජය පූර්ව තක්සේරුවක් සිදු කර තිබේද? එසේ නම්, එක් එක් වත්කම්වල තක්සේරු වටිනාකම් ඇතුළත් වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද? මෙහිදී දැනට මිල්කෝ ආයතනයේ ප්‍රධාන කාර්යාලය සහ කර්මාන්තශාලාව පිහිටා ඇති නාරාහේන්පිට ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කුමක්ද?

එක වෙලාවකට කියනවා, මේ ඉඩම මිල්කෝ ආයතනයට අයිතියි කියලා. තව වෙලාවකට කියනවා මේ ඉඩම UDA එකට අයිතියි කියලා. ඒ පිළිබඳව නිශ්චිත පිළිතුරක් අවශ්‍යයි. ගරු කථානායකතුමනි, Colombo Milk Factory, Ambewela Spray Dried Milk Factory, Digana Milk Factory, Polonnaruwa Condensed Milk Factory වැනි ආයතනත්, ඒ වාගේම NLDB farms 30කුත් විකිණීමට උත්සාහ දරනවා. මැණික්පාලම, බෝපත්තලාව, දයාගම, රොසිටා, මහබෙරියතැන්න, කරඳගොල්ල, හාරගම, මරඳවිල, මැල්සිරිපුර, බෙලිගම, පොලොන්තලාව, ආඬිගම, ගලේපාකුණ, කොවුල්වැව, නාරන්ගල්ල, හොරකැලේ, මාටින්, රුක්අත්තන, සිරින්ගපත, මාරවිල, වැලිසර, මිරිස්වත්ත, පොළොන්නරුව, ඔයාමඩුව, පරසන්ගස්වැව, වැලිකන්ද, කොට්ටුකච්චිය, වීරවිල, රිදියගම, නිකවැරටිය ආදී වශයෙන් NLDB farms 30කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා.

මම අහන්න කැමැතියි, "සෞභාග්‍යයේ ඉදිරි දැක්ම" ට ලැබුණු වරමද මේ ක්‍රියාත්මක කරන්නේ කියලා. සෞභාග්‍යයේ ඉදිරි දැක්මේ තිබුණාද, NLDB farms 30ක්, 31ක් වෙන්දේසි කරනවා කියලා? කරුණාකරලා මේ ප්‍රශ්නවලට මම රජයෙන් පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

4. 2000 වසරෙන් පසුව සම්පූර්ණ කොටස් අයිතිය රජය සතු වන සමාගමක් ලෙස මිල්කෝ ආයතනය පවත්වාගෙන යාමේදී එම එක් එක් වසරවල මිල්කෝ ආයතනය ලැබූ වාර්ෂික ලාභ/ අලාභ තත්ත්වය පිළිබඳව සවිස්තර වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කළ හැකි වන්නේද? නොඑසේ නම්, ඒ මන්ද?

5. මිල්කෝ ආයතනයට සහ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපොළවල් ඉන්දියාවේ අමුල් සමාගම සමඟ ඒකාබද්ධ ව්‍යාපාර සමාගමක් වශයෙන් ස්ථාපිත කිරීමේදී දැනටමත් එම ආයතනවල සේවය කරනු ලබන සියලු සේවකයන් සම්බන්ධයෙන් ගනු ලබන තීරණය කුමක්ද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සේවක සුරක්ෂිතභාවය තහවුරු කරගෙන, සේවක අයිතිය තහවුරු කරගෙන, රාජ්‍ය සම්පත්වල දේශීය අයිතිය තහවුරු කරගෙන ඒ ආයතන පවත්වාගෙන යාමේ අලුත් ක්‍රමවේද ක්‍රියාත්මක විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. නමුත් මේ කටයුත්තේදී විනිවිදභාවයක් නැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා එම සේවකයන්ගේ රැකියා අහිමි වෙනවාද, නැද්ද කියලා අපි දැන ගන්න ඕනෑ.

මේ සියලු සේවකයන්ගේ රැකියා සුරක්ෂිතභාවය තහවුරු කරන්නට රජය සහතික වන්නේද? රැකියා අහිමි වීමක් සිදු වුවහොත් එම සේවකයන්ගේ සුබසාධනය වෙනුවෙන් රජය ක්‍රියාත්මක කරන සැලැස්ම කුමක්ද?

ගරු කථානායකතුමනි, ඉන්දියාව කිරිවලින් ස්වයංපෝෂිතභාවය තහවුරු කරලා තිබෙනවා. වර්ගීස් කුරියන් කියන න්‍යායාචාර්යවරයාගේ නව තාක්ෂණය උපයෝගි කරගෙන, සමුපකාර ආකෘතිය - co-operative model එක - උපයෝගි කරගෙන ඒක පුද්ගල කිරි නිෂ්පාදනය වසර 50ක් තුළ fourfold increase එකකට ඇවිත් තිබෙනවා. ජනගහනයත් වර්ධනය වෙලා තිබෙනවා තමයි. නමුත්, කිරිවල සුරක්ෂිතභාවය තහවුරු කරන්නට ඉන්දියාවට හැකියාව ලැබී තිබෙනවා. අපි දැන ගන්නට ඕනෑ, එක පාරක් අසාර්ථක වුණු අමුල්-ශ්‍රී ලංකා ඒකාබද්ධ වැඩසටහන අද දවසේ සාර්ථක වීම සඳහා පදනම කුමක්ද කියලා. ඒ ගත්ත තීන්දු තීරණ පිළිබඳව විනිවිදභාවයෙන් යුක්ත වූ සාකච්ඡාවක් ඕනෑ. මම මේ කාටවත් මඩ ගහන්න කියනවා නොවෙයි. මට ඒ වෘත්තීය සමිති නියෝජනය කරන නිලධාරින් කියපු කාරණාවක් මේ කියන්නේ. නිලධාරින් ගිහිල්ලා විෂය භාර ඇමතිවරයාගෙන් අහලා තිබෙනවා, මොකක්ද මේ සිද්ධ වෙන්නේ කියලා. ඇමතිවරයා කියලා තිබෙනවා, මට නම් කරන්න දෙයක් නැහැ, මට මේ Cabinet Paper එක ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ආවේ, මම ඒක අත්සන් කරලා දුන්නාය කියලා. මම අහන්නේ, එහෙම කරන්නද ඇමතිවරු ඉන්නේ? ඒ කාරණය ගැන අපට උත්තරයක් අවශ්‍යයි. මම ඒ ගොවිපළවල ලැයිස්තුවක් කියවාගෙන ගියා නේ. මම දැන ගන්න කැමැතියි, මේ ආණ්ඩුවේ වග කිව යුතු පුද්ගලයන්ගෙන්, මේකද සෞභාග්‍යයේ දැක්ම කියලා. මේ රටේ NLDB ගොවිපොළවල් 30කට වැඩි ප්‍රමාණයක් මිල්කෝ එකත් එක්ක විකුණා දැමීමද, සෞභාග්‍යයේ ඉදිරි දැක්ම? ඒක එක එක ප්‍රභූවරුන්ට සෞභාග්‍යයේ දැක්මක් වෙන්න පුළුවන්. නමුත් ඒක රටටම අභාග්‍ය සම්පන්න දෙයක් බව මම කියන්න කැමැතියි. කරුණාකරලා, මේ ගිවිසුම පිළිබඳව ඇති තතු රටට හෙළි කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ස්තුතියි.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithreepala Sirisena)

ගරු කථානායකතුමනි, NLDB farms තිස් ගණනක් මේ විධියට දීම පුදුම ජාතික අපරාධයක්. පොළොන්නරුවේ තිබෙන NLDB farm එකේ අක්කර හත්දාහක් විතර තිබෙනවා. ඒක පොළොන්නරුව නගරයෙන් පටන් ගත්තාම අවසන් වෙන්නේ මහවැලි ගඟ කෙළවරෙන්. ඒකේ සතුන් විශාල ප්‍රමාණයකුත් ඉන්නවා. දේශීය කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත්, පශු සම්පත් අංශත් සමඟ ඒකාබද්ධ වුණු විශේෂඥයන් රාශියක් මේ රටේ ඉන්නවා. පිට රටින්, අමුල් සමාගමෙන් උපදෙස් ගත්තාට කමක් නැහැ; විශේෂඥ උපදෙස් ගත්තාට කමක් නැහැ. ඒ විශේෂඥ උපදෙස් අරගෙන මේ රටේ කිරි නිෂ්පාදනය වැඩි කරන්න. මේ රටේ NLDB farms තිහක් මේ විධියට ලබා දීම නම් මහා ඛේදවාචකයක්; ජාතික අපරාධයක්. ඒ වාගේම මිල්කෝ සමාගම ගැනත් මම කියන්න ඕනෑ. මිල්කෝ සමාගමටත් මේ තත්ත්වය ඇති කරන්න එපා. මිල්කෝ සමාගමත් ආදායම් වර්ධනය කරන්න පුළුවන් ආයතනයක්.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ එම ප්‍රශ්නය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරලා ඉදිරියේදී පිළිතුරක් ලබා දෙන්න කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය, ගරු හෙක්ටර් අප්පුහාමි මැතිතුමා.

## වරප්‍රසාද : "දිවයින" සහ "අරුණ" පුවත් පත් වාර්තා
## சிறப்புரிமை: “திவயின” மற்றும் “அருண” பத்திரிகை அறிக்கைகள்
## PRIVILEGE : “DIVAINA” AND “ARUNA” NEWS REPORTS

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී වරප්‍රසාද ප්‍රශ්නයක් හැටියට මා ඉදිරිපත් කරන මෙම කාරණාව මට විතරක් නොවෙයි, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු සියලුදෙනාටම -225දෙනාටම- බලපාන කාරණාවක් කියා මා හිතනවා. මීට සති දෙකකට විතර ප්‍රථම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙපළක් වන මා සහ ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා සම්බන්ධව "දිවයින" පුවත් පතේත්, "අරුණ" පුවත් පතේත් ඉතා අසත්‍ය ප්‍රවෘත්තියක් පළ වුණා. ඒ වාගේම, ඊට සම්බන්ධ වෙච්ච වෙබ් අඩවි මේක හරියට ඌරෙකුට අසූචි හම්බ වුණා වාගේ හැසිරෙමින්, බොහොම අශීලාචාර ලෙස මාධ්‍ය හසුරුවමින්, ජනමාධ්‍ය වෙනුවට "ජඩ මාධ්‍ය" ලෙස හැසිරෙමින් වැරදිසහගත ප්‍රවෘත්ති පළ කර තිබුණා. ඒක නිවැරදි කරන්න තමයි අද මම මේ අවස්ථාව ලබා ගත්තේ.

මම මේ මාසයේ පළමුවැනි දා ඉතාලියේ මිලානෝ නගරයට ගියා. ඒ ගිහිල්ලා තුන්වැනි දා මගේ තව මිත්‍රයෙක් සමඟ මම මිලානෝ නගරයේ සිට ජිනීවා නගරයට ගියා, දුම්රියෙන්. ඒ සඳහා පැය 4ක කාලයක් ගත වුණා. ඒ පැය 4ක කාලය තුළ අපි ජිනීවා නගරයට ගිහිල්ලා ජිනීවා නගරයේ ප්‍රධාන දුම්රිය ස්ථානය ඉදිරිපිට තිබෙන Hotel International & Terminusහි නතර වෙලා, ජිනීවා නුවර තිබෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ සැසිවාරයට ගියා. හැබැයි මතක තබාගන්න ඕනෑ, මේක සම්පූර්ණයෙන්ම මගේ පෞද්ගලික චාරිකාවක් බව. මගේ පෞද්ගලික මුදල් වියදම් කරලා, මගේ කාලය වැය කරමින් තමයි මම මේ සඳහා ගියේ. මෙය රජයේ ක්‍රියාවලියක්වත්, ජනතාවගෙන් ශත පහක්වත් අරගෙන, අපේ පක්ෂයෙන් ශත පහක්වත් අරගෙන කරපු දෙයක්වත් නොවෙයි. මෙය පෞද්ගලිකව මා ගිය